www.AlevelApi.com



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

චිත්‍ර කලාව II
சித்திரக்கலை II
Art II

51 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් අධ්‍යයනය කිරීම සඳහා යොදාගන්න.**

**උපදෙස්:**

- ඔබේ **විභාග අංකය,** ඔබ චිත්‍රය අඳින කඩදාසියේ **පසුපිටෙහි** පැහැදිලි ව ලියන්න.
- ඔබ වෙත සපයා ඇති විශේෂ **ඇඳීමේ කඩදාසිය** (Drawing paper) වර්ණ චිත්‍රය ඇඳීම සඳහා භාවිත කරන්න. වෙනත් කිසිම චිත්‍රයක් හෝ අධ්‍යයන සටහනක් ඇඳීම අවශ්‍ය නොවේ.
- ඔබගේ චිත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට එය සම්පූර්ණයෙන්ම වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින්, එය ඔබට අවාසිදායක විය හැකි ය.

## ස්වභාවිකත්ව අධ්‍යයනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය

පහත සඳහන් උපදෙස් සැලකිල්ලට ගෙන ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය ඇඳ, වර්ණ කරන්න.

* කඩදාසියේ තලය, අර්ථවත් ව භාවිත කරමින් චිත්‍රය සම්පිණ්ඩනය කරන්න.

* ද්‍රව්‍යයන්ගේ ගතිලක්ෂණ, මතුපිට ස්වභාවය, පරිමාණය, ඇස් මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාලෝක රීති පිළිබඳ ව සැලකිලිමත් වන්න.

* ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ, ඒ මත ආලෝකය හා අඳුර පතිත වී ඇති අයුරු සැලකිල්ලට ගෙන වර්ණ කරන්න.

* වර්ණ මාධ්‍යය හැසිරවීමේ ශිල්ප ක්‍රම අර්ථවත් ව භාවිත කරන්න.

* ද්‍රව්‍ය සමූහයට ගැළපෙන පරිදි වර්ණවත් පසුබිමක් යොදන්න.

* ද්‍රව්‍ය සමූහය තබා ඇති ධාරකයේ (ලෑල්ලේ) පරිමාණය ද්‍රව්‍ය සම්පිණ්ඩනයට ගැළපෙන පරිදි වෙනස් කරගැනීමට හැකි ය.

* දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් යන එක් මාධ්‍යයක් හෝ මාධ්‍යය කිහිපයක් මිශ්‍රිත ව හෝ භාවිත කළ හැකි ය.

* * *

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

චිත්‍ර කලාව III
சித்திரக்கலை III
Art III

51 S III

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්නය තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

- ඔබේ **විභාග අංකය** හා තෝරාගත් **ප්‍රශ්න අංකය** ඔබ චිත්‍රය අඳින කඩදාසියේ **පසුපිටෙහි** පැහැදිලි ව ලියන්න.
- දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් යන එක් මාධ්‍යයක් හෝ මෙම මාධ්‍යයන් කිහිපයක් මිශ්‍රිත ව හෝ භාවිත කළ හැකි ය.
- අවශ්‍ය අයට ඩ්‍රෝෂ කඩදාසි සපයනු ලැබේ.
- චිත්‍රය භාර දෙන විට, එය සම්පූර්ණයෙන්ම වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින් එය ඔබට අවාසිදායක විය හැකි ය.

● පහත සඳහන් **'අ', 'ආ'** සහ **'ඉ'** යන කොටස් තුන අතුරෙන් **එක්** මාතෘකාවක් පමණක් තෝරාගෙන, වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.

**'අ' කොටස - චිත්‍ර සංරචනය**

**1.** තදබදයක් පවතින එළවලු තොග වෙළඳපොළක්

**2.** 'සුන්දර දොළ පාරක අසිරිය දිය නාන පිරිස නිසා තවත් වැඩිවෙලා.'

**3.** වාරකන් දිනක වෙරළේ තනි වූ බෝට්ටු / අනතුරක් ඉව වැටුණු මුව රංචුවක්

**'ආ' කොටස - මෝස්තර නිර්මාණය**

**4.** පිච්ච මල වියුක්තරූපීව යොදාගනිමින් චීත්ත රෙද්දක් සඳහා මුද්‍රණය කිරීමට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක් $9'' \times 9''$ (අඟල්) ප්‍රමාණයේ අවකාශයක් තුළ නිර්මාණය කරන්න. (මූලික මෝස්තර ඒකකය සහ සෙසු කොටස් අතර අන්තර් සම්බන්ධය පැවතීම අපේක්ෂා කෙරේ.)

**5.** සමාන පැති අටක් සහිත කාන්තා කුඩයකට සුදුසු මෝස්තරයක්, මධ්‍ය කේන්ද්‍ර කොටගෙන විහිදී යන සේ නිදහස් හැඩතල භාවිතයෙන් නිර්මාණය කරන්න.

**6.** ජාතික උත්සව අවස්ථාවක් සඳහා යොදාගත හැකි $9' \times 4'$ (අඩි) ප්‍රමාණයේ ධජ පතාකයක් පාරම්පරික සැරසිලි භාවිතයෙන් නිර්මාණය කරන්න. (ධජයේ මූලික හැඩය පරිමාණයට අනුකූලව තලයට ගැළපෙන සේ කුඩා කරගන්න.)

**'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය**

**7.** 'ජාතියක් වශයෙන් එක්ව වසංගතයකට මුහුණ දෙන ආකාරය' පිළිබඳව, පුවත්පතක පළ කෙරෙන විශේෂාංග ලිපියකට සුදුසු වර්ණවත් සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරන්න.

**8.** 'ස්වයංපෝෂිත රටක්' යන තේමාව යටතේ ගෙවතු වගාවේ අගය පැහැදිලි කෙරෙන විචිත්‍රවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.

**9.** දේශීය නිෂ්පාදනයක් ලෙස මිශ්‍ර පලතුරු එකතුවක් (අච්චාරු) ඇසුරුම් කෙරෙන වීදුරු භාජනයක පිටත පෘෂ්ඨයේ ඇලවීම සඳහා ලේබලයක් නිර්මාණය කරන්න. (යෝජිත නාමයක් හා රූපසටහන් ඇතුළත් කරන්න.)

* * *

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .